යම් කිසි ප්‍රවෘත්තියක් තුළ, ඊට සෘජුවම අදාළ නොවන විටකදී යම් පුද්ගලයෙකුගේ හෝ කණ්ඩායමකගේ වර්ගය හෝ වාර්ගිකත්වය ඉස්මතු කොට දැක්වීමෙන් සිදුවන අගතිය වන්නේ ඔවුන්ව කොන් කිරීමකට ලක් වීමයි. දේශීය හා ජාත්‍යන්තර මාධ්‍ය ආචාර ධර්ම තුළද පුවතකට සෘජුව අදාළ නොවන විටකදී වර්ගය හෝ වාර්ගිකත්වය සඳහන් නොකළ යුතු බව සඳහන් වේ.

කෙසේ නමුත් මෙම ආචාර ධර්මය මාධ්‍ය මගින් සෑමවිටකම ආරක්ෂා නොකරයි. මව්බිම (03/12) පුවත්පතේ "කොහුවල ව්‍යාපාරිකයාගේ මරණය අබිරහසක්" යන සිරස්තලයෙන් යුතු පුවත් වාර්තාවේ උප සිරස්තලයේ සඳහන් වන්නේ ඔහු "මුස්ලිම් ව්‍යාපාරිකයෙක්" බවයි. මව්බිම එසේ අදාළ අයගේ වාර්ගිකත්වය සඳහන් කරන්නේ, ඔහුගේ නමද සඳහන් කරනා අතරවාරයේදීයි.

කෙසේ නමුත්, එම පුවතම වාර්තා කරනා මාර්තු 12 දින අනෙකුත් සිංහල භාෂා පුවත්පත් වන දිවයින, දිනමිණ, ලංකාදීප, අරුණ සහ අද පුවත්පත් අදාළ පුද්ගලයාගේ වාර්ගිකත්වයක් සඳහන් නොකරයි.
මෙහිදී මව්බිම ඉස්මතු කරනා වාර්ගිකත්වය අනෙකුත් සිංහල භාෂා පුවත්පත් මගින් ඉස්මතු නොකිරීම තුළ, අදාළ අයගේ වාර්ගිකත්වය පුවතට අදාළ නොවන බව පැහැදිලි වේ. ඒ අනුව, මව්බිම පුවත් වාර්තාව ආචාර ධාර්මික නොවන බවද එසේම සඳහන් කිරීමට සිදුවේ.

#MediaEthicsSL #lkr #Divaina #Mawbima #Aruna #Lankadeepa #Dinamina #Ada